ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | කෘෂි හා ආහාර තාක්ෂණය - I | කාලය පැය 01 යි |
|---|---|---|

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*

01. "අහසින් වැටෙන එක දිය බිඳක් හෝ මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යාමට ඉඩ නොතැබිය යුතුය. " මෙම ප්‍රකාශය කළ රජතුමා වන්නේ,
    1. මහසෙන්    2. දුටුගැමුණු    3. පණ්ඩුකාභය    4. මහාපරාක්‍රමබාහු

02. ශ්‍රී ලංකාවේ උඩරට කලාපයට අයත් ප්‍රදේශවල උච්චත්වය වනුයේ,
    1. 0 – 300 m කි.    2. 300 – 500 m කි.    3. 300 – 900 m කි.    4. 900 ට වැඩි

03. වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාවය බෝග වගා කටයුතු කෙරෙහි බලපාන සාධකයකි. වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩි වූ විට,
    1. ශාක රෝග හා පළිබෝධ හානි වැඩි වේ.
    2. ශාක මුල්වලින් ජල අවශෝෂණය වැඩි වේ.
    3. ධාන්‍ය අස්වනු ගබඩා කාලය වැඩි වේ.
    4. ශාකවල උත්ස්වේදන සීඝ්‍රතාවය වැඩි වේ.

04. ශ්‍රී ලංකාවේ ඉදිකළ ප්‍රථම වැව නම්,
    1. පරාක්‍රම සමුද්‍රයයි.
    2. මින්නේරිය වැවයි.
    3. අභය වැවයි.
    4. කලා වැවයි

05. සූර්ය විකිරණමානය මඟින් මනිනු ලබන දේශගුණික සාධකයකි.
    1. ආලෝක තීව්‍රතාවය
    2. ආලෝකය පවතින කාල සීමාව
    3. ආලෝකයේ ගුණාත්මකබව
    4. ආලෝකයේ පැහැය

06. සුළඟ හමන විට සුළං දිශා දර්ශකයේ ඊ හිස පිහිටනු ලබන්නේ,
    1. සුලං හමා යන දිශාවට යි.
    2. සුලං එන දිශාවට යි.
    3. උතුරු දිශාවට යි.
    4. දකුණු දිශාවට යි.

07. විපරිත පාෂාණයකට උදාහරණයකි.
    1. ග්‍රැනයිට්    2. හුණුගල්    3. කිරිගරුඬ    4. වැලිගල්

08. බීජවල සුප්තතාවය ඇති කරන නිශේදන ද්‍රව්‍ය වන්නේ?
    1. ඔක්සීන    2. කුමරින්    3. රවුන්ඩ් අප්    4. ග්ලයිෆොසෙට්

09. සහතික කළ බිත්තර වී වල ප්‍රරෝහණ ප්‍රතිශතය විය යුත්තේ,
    1. 60 % වඩා වැඩි විය යුතු ය.
    2. 70 % වඩා වැඩි විය යුතු ය.
    3. 85 % වඩා වැඩි විය යුතු ය.
    4. 13 % වඩා වැඩි විය යුතු ය.

10. බීජ සුප්තතාවය ඉවත් කරන ක්‍රමයක් නොවන්නේ,
   1. බීජාවරණය මද වශයෙන් පිලිස්සීම.
   2. තනුක සල්ෆියුරික් අම්ලයේ බීජ ගිල්වීම.
   3. වැලි මිශ්‍ර කර වැපිරීම.
   4. උණු ජලයේ මද වේලාවක් ගිල්වා තැබීම.

11. බල්බිල දැකිය හැකි ශාකයක් වන්නේ,
   1. ගෝනිගස්   2. ගොටුකොළ   3. අමු ඉඟුරු   4. කිරිඅල

12. පැරෂුට් ක්‍රමය මඟින් ක්ෂේත්‍රයේ බීජ පැළ සිටුවීම සඳහා බීජ තවාන් කරනු ලබන්නේ කුමන තවානෙහි ද?
   1. ඩැපොග් තවාන
   2. මඩ තවාන
   3. තැටි තවාන
   4. නෙරිදෝකෝ තවාන

13. අතු කැබලි මුල්අද්දවා ගැනීමට සුදුසුම පරිසර තත්ත්වය වන්නේ?
   1. වැඩි උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාවය
   2. අඩු උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාවය
   3. වැඩි උෂ්ණත්වය හා වැඩි ආර්ද්‍රතාවය
   4. අඩු උෂ්ණත්වය හා වැඩි ආර්ද්‍රතාවය

14. බද්ධ කල පසු බද්ධය සාර්ථක වී ඇත්දැයි බැලීමට බද්ධ පටි ඉවත් කළ හැක්කේ දින කීයකට පසුව ද?
   1. 3 – 4 අතර   2. 5 – 6 අතර   3. 7 – 10 අතර   4. 12 – 14 අතර

15. පටක රෝපණය මඟින්,
   1. පැල සීමිත සංඛ්‍යාවක් ලබාගත හැක.
   2. පැල ගබඩා කිරීම හා ප්‍රවාහනය අපහසු ය.
   3. නිරෝගී පැල ලබාගත හැක.
   4. එම පැල කටුක පරිසර තත්ව වලට ඔරොත්තු දේ.

16. සමෝධාන ගොවිතැනේ වාසියක් නොවන්නේ,
   1. වසර පුරා ආදායම් ලැබීම.
   2. පොහොර හා බල ශක්තිය සඳහා යන වියදම අඩු වීම.
   3. පරිසර හානිය අධික වීම.
   4. සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම.

17. ශෂ්‍ය මාරු ගොවිතැන යනු,
   1. තනි බෝගයක් දිගටම වගා කිරීම ය.
   2. බෝගයක අස්වැන්න නෙලීමට පෙර එම බිමෙහි නව බෝගයක් සිටුවීම ය.
   3. එකම බිමක බෝග කිහිපයක් එකට වගා කිරීම ය.
   4. බෝග කිහිපයක් එකම භූමියේ කන්නයෙන් කන්න මාරු කර වගා කිරීම ය.

18. තවාන් පාත්තියක පසට යෙදිය යුතු සුදුසුම දිලීර නාශකය තෝරන්න.
   1. පැරකොට් ය.   2. කැප්ටාන් ය.   3. ග්ලයිෆොසෙට් ය.   4. සෙරඩික්ස් ය.

19. ජලයේ අද්‍රාව්‍ය විටමින් වන්නේ,
   1. A, B, C, D   2. B, D, K, E   3. A, D, E, K   4. B හා C

20. වර්ධනය බාල වීම, මුඛ කොන් වන වීම, රක්ත හීනතාවය, සමේ වියලි බව, බැරි බැරියාව ආදි රෝග ලක්ෂණ ඇති විය හැක්කේ කුමන විටමින් ඌණතාවයෙන් ද?
   1. $B_1$   2. C   3. D   4. $B_{12}$

21. පුද්ගලයෙකු දිනකට ආහාරයට ගත යුතු ලුණු ප්‍රමාණය කොපමණ ද?
1. 2 g 2. 4 g 3. 5 g 4. 10 g

22. පහත සඳහන් බීජ අතුරින් අධෝභෞම ප්‍රරෝහණය දක්වන බීජය වන්නේ,
1. මුං 2. බෝංචි 3. කඩල 4. වම්බටු

23. ශරීර ස්කන්ධ දර්ශකය යනු,
1. $\frac{\text{ශරීර බර } (kg)}{\text{උස}^2 \text{ (m)}}$ 2. $\frac{\text{ශරීර බර } (kg)}{\text{උස (m)}}$

3. $\frac{\text{ශරීර බර } (kg)}{\text{උස (m)}}$ 4. $\frac{\text{ශරීර බර } (g)}{\text{උස (cm)}}$

24. වීදි බෝග වගාවක් සඳහා වඩාත්ම සුදුසු බෝග වර්ගයකි.
1. සයිප්‍රස් 2. ඇල්බීසියා 3. ග්ලිරිසීඩියා 4. වැට එඬරු

25. ශිෂ්‍යයෙක් තෙත් කළ පස් ගුලියක් ගෙන අතෙන් රෝල් කිරීමේ දී කැඩී යයි. ඔබට හැඟෙන පරිදි මෙම පස් වර්ගය කුමක් ද?
1. ලෝම පසකි. 2. වැලි පසකි 3. මැටි පසකි. 4. වැලි ලෝම පසකි.

26. උත්ස්වේදනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. පසේ ඇති ජලය පස තුළින් පහලට ගමන් කිරීමයි.
2. ශාක පත්‍ර මඟින් ජලය වාෂ්ප ලෙස පිට කිරීමයි.
3. ශාකයෙන් ජලය බිංදු ලෙස ඉවත් වී යාමයි.
4. පසට ලැබෙන ජලය වාෂ්ප ආකාරයෙන් පිට කිරීමයි.

27. ගොවි මහතෙක් වගා ක්ෂේත්‍රයේ පහත සඳහන් පරිදි බෝග වගා කරයි.

කොස් ⟶ පොල් ⟶ සාදික්කා ⟶ කෝපි ⟶ ගස්ලබු ⟶ බඩ ඉරිඟු ⟶ පලා වර්ග

මෙම බෝග වගා පද්ධතිය හඳුන්වන්නේ,
1. හේන් ගොවිතැන ලෙස යි. 2. බහු ස්ථර බෝග වගාව ලෙස යි.
3. වීදි බෝග වගාව ලෙස යි. 4. සමෝධාන ගොවිතැන ලෙස යි.

28. පස සංරක්ෂණය කරන කෘෂි කාර්මික සංරක්ෂණ ක්‍රමයකි.
1. ගල් වැටි බැඳීම 2. කානු කැපීම. 3. වසුන් යෙදීම. 4. පස් වැටි දැමීම.

29. ගොවි මහතෙකු තම ගෙවත්තේ ඇති බෝගවල පත්‍ර දාර කහ පාට වී, දාර පිලිස්සූ ස්වභාවයක් ගෙන ඇති බව නිරීක්ෂණය කරයි. ඔබට හැඟෙන පරිදි මෙය කුමන මූල ද්‍රව්‍ය හිඟ වීමෙන් හට ගැනීමක් ද?
1. නයිට්‍රජන් 2. පොස්පරස් 3. පොටෑසියම් 4. යකඩ

30. පලතුරු මැස්සා පාලනය සඳහා යොදා ගන්නා පෙරමෝන උගුල සඳහා සුදුසු රසායනික ද්‍රව්‍ය වන්නේ,
1. ඉන්ඩෝල් ඇසිටික් අම්ලය 2. මීතයිල් ඉයුජිනෝල්
3. ඉන්ඩෝල් බියුටරික් අම්ලය 4. නැප්තලීන් ඇසිටික් අම්ලය

31. සූර්ය තාප වියලනයක ප්‍රයෝජනයක් නොවන්නේ,
    1. අපද්‍රව්‍ය මිශ්‍ර නොවීම.
    2. සතුන්ගෙන් හානි සිදු නොවීම.
    3. වැසි සහිත තත්ත්වයක දී වියලන ආහාර ආරක්ෂා වීම.
    4. වියදම අඩු වීම.

32. මස්, මාලු වැනි ආහාර ශිතකරණය තුල අධි ශීතන තත්ව යටතේ දීර්ඝ කාලයක් පරිරක්ෂණය කල හැක. එහි දී භාවිතා කරන තත්ත්වයන් වන්නේ,

1. $0^0C$ 2. $-15^0C$ 3. $4^0C$ 4. $-18^0C$

33. "<u>ලැක්ටික් අම්ල පැසවීම</u>" මඟින් පරිරක්ෂණය කරනු ලබන ආහාර වර්ගයකි.

1. චීස් 2. විනාකිරි 3. බටර් 4. වයින්

34. ශ්‍රී ලංකාවේ ගොවීන්ට හඳුන්වා දුන් පළමු දෙමුහුම් වී ප්‍රභේදය මින් කවරක් ද?

1. BG 300 2. BG 450 3. H 4 4. BW 351

35. කිරිදෙනගේ බුරුල්ල ඉදමී රත් පැහැ ගැන්වී, උණුසුම් බවක් පෙන්වයි. මෙම රෝග ලක්ෂණ පෙන්වන රෝගය කුමක් ද?

1. බුරුළු ප්‍රදාහය 2. කිරි උණ 3. වට පණු රෝගය 4. කුර හා මුඛ රෝගය

36. ලූණුවලට අයඩීන් එකතු කිරීම මඟින් පහත සඳහන් කුමන කරුණක් ඉටුවේද?

1. සරු කිරීමක් 2. ප්‍රබල කිරීමක්
3. අවම සැකසීමක් 4. පෝෂක අවශෝෂණය පහසු කිරීමක්

37. කුකුළු පැටව් පාලනයේ දී යොදා ගත යුතු බෲඩරය තුළ පළමු සතියේ දී තිබිය යුතු ප්‍රශස්ත උෂ්ණත්වය?

1. $35^0C - 40^0C$ 2. $33^0C - 35^0C$ 3. $30^0C - 33^0C$ 4. $25^0C - 30^0C$

38. එක් කිරි මුරයක දී නිපදවනු ලබන සාමාන්‍ය කිරි නිෂ්පාදනය අනුව එළ ගව වර්ග ආරෝහණ පිළිවෙලින් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

1. ෆ්‍රිෂියන්, අයර්ෂයර්, ජර්සි, රතුසින්ධි 2. රතුසින්ධි, ජර්සි, අයර්ෂයර්, ෆ්‍රිෂියන්
3. අයර්ෂයර්, ෆ්‍රිෂියන්, රතුසින්ධි, ජර්සි 4. ජර්සි, ෆ්‍රිෂියන්, අයර්ෂයර්, රතුසින්ධි

39. අත් හා උදරය ඉදිමීම, උදරය ඉදිරියට නෙරාවිත් ආහාර අරුචිය ඇති වීම හා පේශි ක්ෂය වීම වැනි රෝග ලක්ෂණ දැකිය හැකි රෝගය වන්නේ,

1. මැරැස්මස් 2. ගලගණ්ඩය 3. ක්වොෂියෝකෝර් 4. ඔස්ටියෝපොරෝසිස්

40. පාලිත තත්ව යටතේ බෝග වගාවේ දී යොදා ගන්නා ස්ථිර වගා ව්‍යුහයක් වන්නේ,

1. සූර්ය ප්‍රචාරකය 2. තනි පැළ ආවරණය 3. ජේලි ආවරණය 4. හරිතාගාරය

**(1 x 40 = 40)**

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | කෘෂි හා ආහාර තාක්ෂණය - II | කාලය පැය 02 යි |
|---|---|---|

- *පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.*

01. වර්තමානයේ දී සමාජය මුහුණ දෙන කොරෝනා වසංගතයත් සමඟම ඇතිවන ආහාර හිඟවීමේ අර්බුදයට පිළියමක් ලෙස ගෙවතු වගාව ජනප්‍රිය වෙමින් පවතී.

(i) ගෙවතු වගාවේ දී අනුගමනය කරන බෝග රටාව කුමක් ද? *(ල.02)*

(ii) ගෙවත්තක වගා කළ හැකි පහත සඳහන් කුලවලට අයත් බෝග 2 බැගින් සඳහන් කරන්න.
   (a) සොලනේසියේ
   (b) කුකර්බිටේසියේ *(ල.02)*

(iii) ගෙවතු වගාවෙන් ලැබෙන බෝග අවශේෂ ප්‍රයෝජනයට ගතහැකි අවස්ථා දෙකක් ලියන්න. *(ල.02)*

(iv) කුඩා ගෙවත්තක ප්‍රාථමික බිම් සැකසීමට යොදාගත හැකි උපකරණ 4 ක් ලියන්න. *(ල.02)*

(v) අස්වැන්න නියමිත පරිනත අවස්ථාවට පත්වීමට පෙර නෙළා ගැනීම නිසා ඇති වන ගැටලු 2 ක් සඳහන් කරන්න. *(ල.02)*

(vi) ගෙවතු වගාවේ දී කාබනික පොහොර යොදා ගැනීමෙන් ලැබෙන වාසි 2 ක් ලියන්න. *(ල.02)*

(vii) (a) ගෙවත්තෙන් ලැබෙන අඹ, පැපොල් වැනි පලතුරුවල අතිරික්ත අස්වැන්න සංරක්ෂණය කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.
   (b) ගෙවත්තක් පවත්වාගෙන යාමෙන් ලැබෙන වාසි 02 ක් ලියන්න. *(ල.02)*

(viii) බෝග වගාවට අමතරව ගෙවත්තට එකතු කළ හැකි වෙනත් අංග 02 ක් නම් කරන්න. *(ල.02)*

(ix) වීදුරු ඇසුරුම් තුළ ආහාර ගබඩා කිරීමේ වාසියක් ලියන්න. *(ල.02)*

(x) ආහාර ඇසුරුමක ලේබලයේ සඳහන් විය යුතු මූලික කරුණු 02 ක් සඳහන් කරන්න. *(ල.02)*

02. (i) (a) තවාන් ජීවානුහරණය කිරීමේ අරමුණු 02 ක් ලියන්න. *(ල.02)*
   (b) තවාන්වලට බහුලව වැළඳෙන රෝගයක් නම් කර එයට හේතුවන රෝගකාරක විශේෂය හඳුන්වන නම සඳහන් කරන්න. *(ල.02)*

(ii) තවාන් පස් මිශ්‍රණය සකස් කර ගන්නා ආකාරය විස්තර කරන්න. *(ල.03)*

(iii) (a) තවානක් භාවිතා නොකර කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවිය හැකි එළවළු බීජ වර්ග 4 ක් ලියන්න. *(ල.02)*
   (b) නෙරිදෝකෝ තවානක් සකස් කර ගැනීමෙන් ලැබෙන වාසියක් සඳහන් කරන්න. *(ල.01)*

03. (i) "කෘෂි කර්මාන්තයේ දී බෝග වගාව කෙරෙහි දේශගුණික සාධක සෘජුවම බලපායි."
   (a) සරල වර්ෂාමානයක් ඇඳ එහි කොටස් නම් කරන්න. *(ල.02)*
   (b) වර්ෂාමානයක් ස්ථානගත කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු 2 ක් ලියන්න. *(ල.02)*

(ii) වායුගෝලයේ වැඩි සාපේක්ෂ ආර්ද්‍රතාවය බෝග වගාවට හිතකර හා අහිතකර ලෙස බලපාන ආකාර 2 ක් බැගින් වෙන වෙනම ලියන්න. *(ල.02)*

(iii) "පාංශු ස්වභාවය අනුව වගා කටයුතු සැලසුම් කර ගැනීමට සිදු වේ."
   (a) පාංශු ඛනිජ කොටස් නම් කරන්න. *(ල.02)*
   (b) පාංශු වයනය අර්ථ දක්වන්න. *(ල.01)*
   (c) පාංශු වයනය වගා කටයුතු වල දී වැදගත් වන ආකාරයක් නම් කරන්න. *(ල.01)*

04. පළිබෝධ හානි බෝග වගාවේ දී ඵලදාව අඩු වීමට බලපාන සාධකයක් ලෙස ගත හැකි ය.

(i) ප්‍රධාන පළිබෝධ කාණ්ඩ 3 නම් කරන්න. *(ල.1½)*

(ii) (a) වල් පැලෑටියක් යනු කුමක් ද? *(ල. 02)*

(b) වල් පැලෑටිවලින් ඇතිවන අහිතකර බලපෑම් 3 ක් ලියන්න. *(ල. 1½)*

(c) වල් පැලෑටි මර්දනය කළ හැකි යාන්ත්‍රික ක්‍රම 2 ක් සඳහන් කරන්න. *(ල. 02)*

(iii) (a) හිටුමැරීමේ රෝගය හඳුනාගත හැකි රෝග ලක්ෂණ 2 ක් ලියන්න. *(ල.02)*

(b) පළිබෝධ පාලනයට යොදා ගත හැකි රසායනික නොවන ස්වභාවික පළිබෝධ නාශකයක් සඳහන් කරන්න. *(ල.01)*

05. ශාක සතු ප්‍රජනන හැකියාව උපයෝගි කර ගනිමින් ශාක ප්‍රචාරණයේ දී වගා කටයුතුවලට අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය නිපදවා ගැනීම සිදු කරයි.

(i) ස්වභාවික වර්ධක ප්‍රචාරණයේ දී යොදා ගන්නා භූගත කඳන් වර්ග 4 ක් හා ඒවාට එක් නිදසුන බැගින් සඳහන් කරන්න. *(ල.04)*

(ii) (a) බීජ සුප්තතාවය යනු කුමක් ද? *(ල.02)*

(b) පහත දැක්වෙනබීජ වර්ගවල සුප්තතාවය ඉවත් කර ගැනීමට සුදුසු ක්‍රමය බැගින් සඳහන් කරන්න.

1. සියඹලා -
2. පැපොල් - *(ල.02)*

(iii) මුල් ඇදීම උත්තේජනය සඳහා යොදා ගන්නා වර්ධක හෝමෝන 2 ක් ලියන්න. *(ල.02)*

06. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආහාරය බත් ය. එය වී ශාකයෙන් ලබා ගන්නා බැවින්, ශ්‍රී ලංකාව තුළ වී වගාවට හිමි වන්නේ සුවිශේෂි ස්ථානයකි.

(i) ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා ඇති විභවයන් 3 ක් සඳහන් කරන්න. *(ල.03)*

(ii) (a) ශ්‍රී ලංකාවේ පාරම්පරික වී ප්‍රභේද දෙකක් ලියා ඒවායේ විශේෂිත ලක්ෂණය බැගින් ලියන්න. *(ල.02)*

(b) බිත්තර වී සාම්පලයක තිබිය යුතු ප්‍රමිති 4 ක් ලියා දක්වන්න. *(ල.02)*

(iii) (a) වි වගාවේ දී වැපිරීමට වඩා පැල සිටුවීමේ ඇති වාසි 2 ක් ලියන්න. *(ල.02)*

(b) වී වගාවේ කිරි වදින අවස්ථාවේ දී බහුලව හානි කරන කෘමියා නම් කරන්න. *(ල.01)*

07. වර්තමාන ශ්‍රී ලංකාව තුළ සත්ත්ව පාලනය ලාභදායි ව්‍යාපාරයක් ලෙස ප්‍රචලිත වෙමින් පවතී.

(i) (a) සත්ත්ව පාලනය සඳහා ශ්‍රී ලංකාව තුළ ඇති විභවයන් 2 ක් ලියන්න. *(ල.02)*

(b) ශ්‍රී ලංකාවේ ගව පාලනය සඳහා යොදා ගන්නා විශේෂිත කලාප අතරින් 4 ක් සඳහන් කරන්න. *(ල.02)*

(ii) කෘතිම සිංචනය සිදු කිරීමේ වාසි 2 ක් ලියන්න. *(ල.02)*

(iii) (a) බෲඩරයක් තුළ අඩු උෂ්ණත්වයේ දී වැඩි උෂ්නත්වයේ දී හා ප්‍රශස්ත උෂ්ණත්වයේ දී කුකුලු පැටවුන් විසිරී ඇති ආකාරය නම් කළ රූප සටහන් ඇසුරින් විස්තර කරන්න. *(ල.03)*

(b) පහත දැක්වෙන ද්‍රව්‍ය කුකුළු පාලනයේ දී යොදා ගන්නා අවස්ථාව බැගින් ලියන්න.

1. අලුහුනු -
2. සිප්පිකටු - *(ල.01)*

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)
# 11 ශ්‍රේණිය
# කෘෂිවිද්‍යාව I – II (පිළිතුරු පත්‍රය)

## 1- පත්‍රය.

| | | | |
|---|---|---|---|
| 1 - 4 | 11 - 1 | 21 - 3 | 31 - 4 |
| 2 - 4 | 12 - 3 | 22 - 3 | 32 - 4 |
| 3 - 1 | 13 - 3 | 23 - 1 | 33 - 1 |
| 4 - 3 | 14 - 4 | 24 - 3 | 34 - 3 |
| 5 - 1 | 15 - 3 | 25 - 4 | 35 - 1 |
| 6 - 2 | 16 - 3 | 26 - 2 | 36 - 2 |
| 7 - 1 | 17 - 4 | 27 - 2 | 37 - 2 |
| 8 - 2 | 18 - 2 | 28 - 3 | 38 - 2 |
| 9 - 4 | 19 - 3 | 29 - 3 | 39 - 3 |
| 10 - 3 | 20 - 1 | 30 - 2 | 40 - 4 |

**II කොටස**

01. (i) මිශ්‍ර බෝග වගාව *(ල.02)*
- (ii) (a) මිරිස්, බටු, තක්කාලි
  - (b) කරවිල, වට්ටක්කා, පතෝල *(ල.02)*
- (iii) වසුන් ලෙස, සත්ව ආහාර ලෙස, කාබනික පොහොරක් ලෙස *(ල.02)*
- (iv) උදැල්ල, උදළු මුල්ලුව, පා මුල්ලුව, අලවංගුව *(ල.02)*
- (v) ආවේණික වර්ණය, වෙනස්වීම, සුවඳ නැතිවීම, බර අඩුවීම, බීජ හැකිළීම. *(ල.02)*
- (vi) වස විසෙන් තොර ආහාර ලබාගත හැකිවීම, වියදම අඩුවීම, සමතුලිත ආහාර ලබාගත හැකිවීම. *(ල.02)*
- (vii) (a) ජෑම් සෑදීම, සාන්ද්‍රීකරණය, කෝඩියල් සෑදීම
  - (b) සමබල ආහාර වේලක් ලබාගත හැකිවීම, අතිරේක ආදායමක් ලැබීම *(ල.02)*
- (viii) සත්ව පාලනය, මී මැසි වගාව *(ල.02)*
- (ix) ආහාර සමඟ ප්‍රතික්‍රියා නොකිරීම, ඉහළ උෂ්ණත්වයට ඔරොත්තුදීම, තෙතමනය, වාතය, ගන්ධය හා ක්ෂුද්‍රජීවින්ට ඇතුළුවිය නොහැක, නැවත නැවත භාවිත කළ හැකි හැකිවීම, ප්‍රතිචක්‍රීකරණය කළ හැකිවීම. *(ල.02)*
- (x) පොදු නාමය, නිෂ්පාදනයේ වෙළඳ නාමය, ශුද්ධි අන්තර්ගතය, නිෂ්පාදිත හා කල් ඉකුත්වීමේ දිනය *(ල.02)*

02. (i) (a) තවාන් මාධ්‍යයේ සිටින ව්‍යාධි ජනකයින් විනාශ කිරීම, කෘමි හා වෙනත් පලිබෝධ කොටස් විනාශ කිරීම. *(ල.02)*
  - (b) • දියමලන් කැම • හිටුමැරීම *(ල.02)*
- (ii) වෙන වෙනම හලාගත් මතුපිට පස් සහ කාබනික පොහොර 1:1 අනුපාතයට මිශ්‍ර කර තවාන් මිශ්‍රණය සාදා *ගනු ලැබේ.* *(ල.03)*
- (iii) (a) බණ්ඩක්කා, පතෝල, වට්ටක්කා, බෝංචි, කරවිල *(ල.02)*

b. •මූල මණ්ඩලයට හානි නොවන ලෙස පැළ ලබා ගත හැකිවීම.

(ල.01)

•සාමාන්‍ය වියලි කාලගුණික තත්වයන් යටතේදී වුවද සිටුවිය හැකිවීම.

03. i. a.






ක්‍රමාංකික මිනුම්

සරල වර්ෂාමානය

b. එළිමහන් ස්ථානයක් වීම, පුනීල කට පොළව මට්ටමේ සිට 30cm ක් උසින් සිටින සේ තැබීම.

(ල.02)

ii. •හිතකර බලපෑම් - දඩු කැබලි මුල් ඇද්දවීමට. ජල සම්පාදනය කළ යුතු ප්‍රමාණය අඩුවීම.

•අහිතකර බලපෑම් - ශාක රෝග ආසාදනය ඉහළයාම, අස්වනු නෙලීමට හා වියලීමට අපහසුවීම.

(ල.02)

iii. a. බොරළු, වැලි, රොන්මඩ, මැටි

(ල.02)

b. පසේ ඇති විවිධ විශාලත්වයෙන් යුතු පස් අංශු වල (වැලි, මැටි, රොන්මඩ) සාපේක්ෂ ව්‍යාප්තිය අනුව අනට දැනෙන ස්වභාවය.

(ල.01)

c.i.•බෝග තෝරා ගැනීමට, ජල සම්පාදන ක්‍රම සැලසුම් කිරීමට.

(ල.01)

•බිම් සැකැස්ම හා පාත්ති සකස් කිරීමට.

04. i. රෝග, කෘමි හා කෘමි නොවන පළිබෝධ, වල් පැළෑටි.

(ල.1.5)

ii. a. වගා කරනු ලබන බෝගය හැරුණුවිට එම වගා බිමෙහි වැඩෙන ඕනෑම පැළෑටියක් වල් පැළෑටියක් ලෙස හඳුන්වයි.

(ල.02)

(b) පෝෂක, හිරුඑළිය, ඉඩකඩ සඳහා බෝගය සමඟ තරඟ කිරීම, පිළිබෝධ හා රෝග කාරක වලට ධාරක ශාක ලෙස ක්‍රියා කිරීම, ජල මාර්ග අවහිර වීම, අස්වනු නෙළීමට අපහසු වීම, භූමිවල කෘෂිකාර්මික වටිනාකම අඩුවීම. ***(ල. 1½)***

(c) අතින් උදුරා දැමීම, උදලු ගෑම. ***(ල. 02)***

(iii) (a) ශාක මැලවීම, මැලවූ ශාකයට කඳ කැපූ විට ඇලෙන සුලු දියරයක් වැස්වීම. ***(ල.02)***

(b) දුම්කොළ සාරය, සබන් දියර, සුදුලූණු සාරය, කොහොඹ ඇට නිස්සාරක ආදිය ***(ල.01)***

05. (i)
- කෝම - හබරල, ගහල
- රෛසෝම - කහ, ඉඟුරු
- බල්බ - ලූණු
- ස්කන්ධ ආකන්ද - අර්තාපල් ***(ල.04)***

(ii) (a) මේරූ ජීවී බීජයකට ප්‍රරෝහනය වීමට අවශ්‍ය සාධක ලැබී තිබියදීත් එය ප්‍රෙරා ්හනය නොවේ නම් එම තත්වය බීජ සුප්තතාවයයි. ***(ල.02)***

(b)
- සියඹලා - දිලිසෙන බීජාවරණය සූරා ඉවත්කිරීම.
- පැපොල් - ජලයෙන් සෝදා ජීවාණුහරනයෙන් ඇති නිෂේධන ද්‍රව්‍ය ඉවත් කිරීම.***(ල.02)***

(iii)
- **ඉන්ඩෝල් ඇසිටික් අම්ලය**
- **ඉන්ඩෝල් බියුට්‍රික් අම්ලය** ***(ල.02)***

06. (i)
- ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම පහත් බිම්වල වී වගා කිරීමට හැකිවීම.
- වී වගාවට අදාල පරියේෂණ හා අභිජනන මධ්‍යස්ථාන තිබීම.
- වී වගාව සඳහා ඇති රාජ්‍ය අනුග්‍රහය ***(ල.03)***

(ii) (a)
- සුවදැල් - සුදු පැහැති සහල් වර්ගයකි
- කුරුලු තුඩ වී - රතු පැහැ කුඩා සහලකි.(ල.02)

(b)
- පැලවීමේ ශක්තිය 85%
- තෙතමනය 13%
- වර්ග පවිත්‍රතාවය 98%
- යාන්ත්‍රික හානිවලට ලක්වූ බීජ සංඛ්‍යාව අවම වීම. වී 500 g හානි වූ බීජ 200 ක් උපරිම පැවතීම. ***(ල.02)***

(iii) (a) ***අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු වීම.*** ***(ල.02)***

•ක්ෂේත්‍රයේ සියුම්ව සකස් කිරීමට අවශ්‍ය නොවීම

*(ල.02)*

b. ගොයම් මකුණා

*(ල.01)*

07. i. a. •උසස් නිෂ්පාදන හැකියාව ඇති සතුන් ඇති කිරීමට සුදුසු දේශගුණික කලාප තිබීම.

වාර්ෂිකව එකතු වන විශාල බෝග අවශේෂ ප්‍රමාණය සත්ත්ව ආහාර ලෙස යොදා ගැනීමට හැකි වීම.

•රැකියා විරහිත පුද්ගලයන්ට සතත්ව පාලනයට යොමු වීමට හැකිවීම.

•අවශ්‍ය තෘණ හා ශාක පත්‍ර ස්වභාවිකවම සපයා ගැනීමට හැකිවීම.

*(ල.02)*

b. •උඩරට කලාපය

•මැදරට කලාපය

•පහතරට තෙත් කලාපය

•පොල් ත්‍රිකෝණය

*(ල.02)*

ii. •උසස් වර්ගයේ සත්වයකුගේ ශුක්‍රාණු ගබඩා කර වසර ගණනාවක් භාවිත කළ හැකිවීම.

•පට්ටි ගවයකු නඩත්තු කිරීමට අවශ්‍ය නොවීම.

*(ල.02)*

iii. a.



අඩු උෂ්ණත්වය

වැඩි උෂ්ණත්වය

ප්‍රශස්ත උෂ්ණත්වය

අඩු උෂ්ණත්වයකදී පැටවුන් බල්බය ආසන්නයේත්, වැඩි උෂ්ණත්වයේදී බල්බයෙන් ඈතට වීමත්, ප්‍රශස්ත උෂ්ණත්වයේදී සාමාන්‍ය පරිදි හැසිරීම දක්නට ලැබේ. (ල.01)

b. •අලුහුනු - ඝන ආස්තරනය තෙත්වූ විට වියළා ගැනීමට
•සිප්පි කටු - බිත්තර දමන කිකිළියන් සඳහා ආහාර ලෙස එකතු කිරීම
(ල.01)



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440